312

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන
පස්වන මට්ටම - 2022/2023
අවසාන පරීක්ෂණය 2023
STU5512- අධ්‍යාපනයේ පදනම
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.11.13 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "අධ්‍යාපන සංකල්පය තුළ ක්‍රියාවලීන් සමුදායක් (Family of Process) අන්තර්ගත වී ඇත." ආර්.එස්.පීටර්ස්.
මෙම ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් 'අධ්‍යාපනය' යන සංකල්පය අර්ථ දක්වන්න.

02. "අධ්‍යාපන දර්ශනය" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

03. කාල්මාක්ස් ඉදිරිපත් කළ වැදගත් අධ්‍යාපන යෝජනා පහක් (05) දක්වන්න.

04. "සංස්කෘතිය" සහ "සමාජානුයෝජනය" යන සංකල්ප පැහැදිලි කරන්න.

05. සමාජ ස්ථරායන පද්ධති හතර (04) නම් කර ඉන් එකක් (01)කෙටියෙන් විස්තර කරන්න.

06. වර්තමානයේ දී නොවිධිමත් අධ්‍යාපනය සමාජයට අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් ව ඇත. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දෙකක් (02) සපයන්න.

07. ශ්‍රී ලංකාවේ ද්විතියික පාසල් අධ්‍යාපනයේ විද්‍යාමාන වන ගැටලු පහක් (05) සඳහන් කරන්න.

08. සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධනය සඳහා අධ්‍යාපනයට පැවරෙන වගකීම් හතරක් (04) දක්වන්න. (ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) දර්ශනය විෂයය තුළ දැකිය හැකි ප්‍රධාන පැති තුන (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන දර්ශනයේ ප්‍රධාන එළඹුම් දෙක (02) නම් කර ඉන් එකක ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) අධ්‍යාපන දර්ශනය ගුරුවරයාට ප්‍රයෝජනවත් වන්නේ ඇයි? හේතු තුනක් (03) දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 09)

10. (i) රූසෝගේ අධ්‍යාපන දර්ශනයට අනුව ළමයින් අධ්‍යාපනය ලබන මාධ්‍ය තුන (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) රූසෝ යෝජනා කළ අධ්‍යාපන සැලැස්ම විද්‍යා විෂයයට අදාළ ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබට යොදා ගත හැකි ඉගැන්වීම් උපාය මාර්ග තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) එම ඉගැන්වීම් උපාය මාර්ග යෙදීමේ දී ඔබට මුහුණ දීමට සිදුවේ යැයි අපේක්ෂා කරන ගැටලු තුනක් (03) දක්වා එම ගැටලු මගහරවා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 09)

11. (i) "ආකල්ප" සහ "සාරධර්ම" අතර ඇති යහපත් සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "සදාචාරය" යනු කුමක්දැයි නිර්වචනය කර ළමුන්ගේ සදාචාර සංවර්ධනය සඳහා පාසල් මට්ටමින් සිදුකළ හැකි විෂය බාහිර ක්‍රියාකාරකම් තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සාරධර්ම අධ්‍යාපනයෙන් සිසුන් තුළ යහපත් ජීවන දර්ශනයක් ගොඩනැගිය හැකි ආකාරය උදාහරණ ඇසුරින් දක්වන්න. (ලකුණු 08)

12. (i) සමවයස් කණ්ඩායමක් යනු කුමක් දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) නවයොවුන් වියේ දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි සමවයස් කණ්ඩායම්වල ධනාත්මක හා ඍණාත්මක බලපෑම් හතරක් (04) බැගින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) පාසල්වල "සැඟවුණු විෂයමාලාව" ළමුන්ගේ සමාජානුයෝජනයේ දි වැදගත් භූමිකාවක් ඉටු කරන්නේ දැයි ඔබ සිතන්නේ ද? හේතු තුනක් (03) සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) "යාවජීව අධ්‍යාපනයේ" ප්‍රධාන ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) "විවෘත අධ්‍යාපනය" යන සංකල්පය විස්තර කර විවෘත -දුරස්ථ අධ්‍යාපන ඉගෙනුම් ලාභියෙකු ලෙස ඔබගේ අත්දැකීම් තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 08)

(iii) විවෘත අධ්‍යාපන ආයතනයක විශේෂ ලක්ෂණ හතරක් (04) සඳහන් කර එය එහි ඉගෙනුම් ලාභීන්ගේ අරමුණු ඉටුකර ගැනීමට දක්වන දායකත්වය අගයන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.